# නූතන සිංහල වේදිකා නාට්‍ය කලාවේ විකල්පීය ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක්

ධනංජය ඩී . බස්නාගොඩ

**" නූතන සිංහල වේදිකා නාට්‍ය කලාවේ විකල්පීය ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක් "**

**විභාග අංකය - 10724**

**ලියාපදිංචි අංකය - HS / 2005 / 10724**

**2009-2010 අධ්‍යයන වර්ෂය**

**සිංහල අධ්‍යයනාංශය,**

**රුහුණ විශ්වවිද්‍යාලය,**

**මාතර.**

## පරිච්ඡේද සාරාංශය

කිවි නළුවේ සිට ඇරඹී යයි සිතිය හැකි සිංහල නාටක ඉතිහාසය සොකරියෙන් කෝලම් නාටකයටත් ඉන් නාඩගමටත් නූර්තියටත් පැමිණ ජෝන් ද සිල්වා, සිරිසේන විමලවීර, මිනර්වා නාට්‍ය යුග පසු කරමින් පරිවර්තිත විශ්වවිද්‍යාල නාටක හරහා සරච්චන්ද්‍ර යුගයෙන් නූතන සිංහල වේදිකාවට පිවිසෙයි. පසු ව ශෛලීගත නාටකයෙන් නැවත දෙබස් නාටකයට ගමන් කොට, 70 දශකයේ දී ව්‍යාජ ජනතාවාදී ප්‍රවනතාවකට ගොදුරු වී ක්‍රමක්‍රමයෙන් විවිධ ප්‍රවණතාවන් අත් කර ගනිමින් අද නාට්‍ය කලාව තෙක් පැමිණ තිබේ. එකී වග 80 දශකය දක්වා පළමු පරිච්ඡේදයෙන් දක්වා තිබේ.

ඒ ආ ගමන් මඟ තුළ අප සතු ව පැවති විකල්ප නාටක පිළිබඳ සාකච්ඡා කෙරෙන දෙ වන පරිච්ඡේදයේ දී මෙතෙක් පැවති පන්ති කාමර නාට්‍ය, පාසල් නාට්‍ය, පාස්කු නාට්‍ය, වෙසක් නාට්‍ය, රූකඩ නාට්‍ය, පසුබිම් දෙබස් කථන මුද්‍රා නාට්‍ය, වීදි නාට්‍ය, කෙටි නාට්‍ය පසු කරමින් නව විකල්ප නාටක ලෙස "බ්ලැක් බොක්ස්" නාට්‍ය සහ "ජන කරළිය" නාට්‍ය අප විකල්ප නාට්‍ය ගොන්නට එකතු වූ ආකාරය සංක්ෂේපයෙන් සාකච්ඡා කෙරේ.

තෙ වන පරිච්ඡේදයෙන් නූතන ලාංකේය වේදිකාවේ පවතින අර්බුදයන් පිළිබඳ සාකච්ඡා කෙරෙන්නේ, මී ළඟ පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරෙන නූතන ලාංකේය වේදිකාවේ නව විකල්පීය ප්‍රවණතාවන් එකී අර්බුද කොතරම් දුරට ජය ගනිමින් ජනගත වේ ද යන්න සළකා බැලීමට පූර්ව සාධන පත්‍රයක් සැකසීමේ අටියෙනි. එය සිව් වන පරිච්ඡේදයේ දී අදාල විකල්පීය ප්‍රවණතාවන් සමඟ සසඳමින් නූතන ලාංකේය වේදිකාව කෙතෙක් දුරට ජයගෙන ඇත්දැයි යන්න සහ එය කෙතරම් සාධනීය වැඩ පිළිවෙලක් ද යන වග ඉදිරිපත් කෙරේ.

එකී විකල්පයන් නූතන ලාංකේය වේදිකාවට සරිලන අයුරින් තව දුරටත් වෙනස් විය යුතුව ඇති තැන් ද, ඒ සඳහා ගත යුතු විකල්ප ක්‍රියාමාර්ග සහ එහි වැදගත්කම ද මෙම ස්වාධීන පර්යේෂණ නිබන්ධයෙන් අවසාන වසයෙන් සමාලෝචනය කර ඇත.

# හැඳින්වීම

නූතන ලාංකේය නාට්‍ය කලාව තුළ කොයි දෙසින් බැලුව ද අසන්නට ලැබෙන්නේ නාට්‍ය කලාව පිළිබඳ අර්බුදයකි. පසුගිය වසර හතර පහ ඇතුලත අගනුවරින් පිට වේදිකාගත වුණු නාට්‍ය බොහෝමයක් අතුරින් ප්‍රේක්ෂකාගාරය අඩක් හෝ පිරුණේ එහෙමත් නාට්‍යයක ය. නමුත් ප්‍රසිද්ධ විකට නළුවන් රඟන "තොත්ත බබාලා", "මෑන් ද මෑන්", " කැප්ටන් කුල්" වැනි නාට්‍යවලට නාට්‍ය ශාලා පිරී ඉතිරී යන තරම් ප්‍රේක්ෂකයන් සිටි අතර, වේදිකා මත සැණකෙළි කළ එම නාටක මීට වසර දොළහකට පමණ පෙර මා පාසල් යන සමයේ මාගේ පරමාදර්ශ නාට්‍ය ද විය. නාට්‍ය කලාව කෙරෙහි ඇල්මෙන් සිටිය ද, එකල අද දවසේ මෙන් සාහිත්‍ය කලාව පිළිබඳ නිවැරදි ආකල්ප අප සතු ව නො වීම ඊට හේතු වී යයි මම විශ්වාස කරමි. නමුත් නාට්‍ය හා රංග කලාව ද, ව්‍යවහාරික රංග කලාව ද ඉගෙනීමත් රවීන්ද්‍ර මාපිටිගම, එච්. ඒ. පෙරේරා, පරාක්‍රම නිරිඇල්ල, මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික රංග කලාව පිළිබඳ මහාචාර්ය ජේම්ස් තොම්සන් යන මහතුන් සමඟ ද බොහෝ තරුණ හා ආධුනික නාට්‍යකරුවන් සමඟ ද නිර්මාණ හා අධ්‍යයනයන්ට සම්බන්ධ වීමට ලැබීමෙන් කෙමෙන් මම නාට්‍ය කලා විමර්ශනයට යොමු වීමි.

මා ලංකාවේ නාට්‍ය කලාව ගමන් කරන දිශානතිය පිළිබඳ විමසිලිමත් වන්නට වූයේ මාගේ ගුරුවරුන් නිසා යයි සිතේ. මා ආධුනිකයකු වසයෙන් නාට්‍ය පිටපත් කිහිපයක් ලියා තිබුණ ද ඒවා වේදිකාවට නැගීමට තරම් මාගේ ආකල්ප පොහොසත් නොවූයේ රංග භාණ්ඩ, රංග වස්ත්‍ර, වේදිකා පසුතල පිළිබඳ මා පෙර දී නැරඹූ නාට්‍යවලින්, නාට්‍ය යනු මේ යයි මා නිශ්චය කර ගත් පූර්ව නිගමන නිසාවෙනි. නමුත් ඒ ආකල්ප වෙනස් වීමට කරුණු තුනක් බලපෑවේ යයි මම සිතමි.

''මම පෞද්ගලිකව විස්වාස කරනවා වේදිකාවේ කරල පෙන්නන්න බැරි දේවල් නැහැ කියන එක'' යනුවෙන් රවීන්ද්‍ර මාපිටිගම ගුරු තුමා පැවසූ අවස්ථාව එකකි.

අනෙක් අවස්ථාව

'' ප්‍රේක්ෂකයන් පිරිසකට රැස් වෙන්න පුළුවන් ඉඩකඩක් තියෙන ඕන ම තැනක නාට්‍යයක් පෙන්වන්න පුළුවන්'' යන පරාක්‍රම නිරිඇල්ල ගුරුතුමාගේ ප්‍රකාශයත්;

පළමු වරට තඹුත්තේගම ජන කරළිය ජංගම රඟහලේ ''චරන්දාස් නාට්‍ය බැලීමෙන් ලද උද්දාමයත් ඒ කරුණු වේ.

සෙනඟ වැඩි වූ බැවින් 6.30 දර්ශනයෙන් පසු දෙ වන දර්ශනයක් රාත්‍රී 10.30 ට පමණ ඇරඹුණු අතර ඒ දර්ශනය නැරඹූ අප රඟහලෙන් පිටතට පැමිණියේ අපේ ඔළුවල පැලපදියම් වී තිබූ නාට්‍ය කලාව පිළිබඳ සාම්ප්‍රදායික බැමි සුණු විසුණු වී ගොස් අලුතෙන්

උපන් උන් මෙනි. මා සෙවූ නාට්‍ය කලාවත්, වේදිකාවේ පවතින අර්බුද පිළිබඳ නාට්‍යකරුවන් නඟන මැසිවිලිවලට පිළිතුරුත් එහි තිබුණි.

එ බැවින් තවත් එ වැනි විකල්පයන් සොයමින් පොත පත අධ්‍යයනයටත් අන්තර්ජාල ගවේෂණයටත් හුරුවුණු අතර ඒ සියල්ල ඔස්සේ ලංකාවට ගැලපෙන විකල්ප නාට්‍ය ක්‍රමවේදයක් පිළිබඳ සිතන්නට වීමි.

මෙම අධ්‍යයනය සඳහා සම්පත් දායකයින් වසයෙන් එම්. සෆීර්, රාජිත දිසානායක, පරාක්‍රම නිරිඇල්ල යන නාට්‍යවේදීන් සම්බන්ධ කරගත් අතර මා එකී විකල්ප ප්‍රවණතාවන් පිළිබඳ විචාරන්නට යෙදුණේ මෙතෙක් මා අත්විඳි වේදිකාවේ අද්දැකීම් අනුව ය. නාට්‍ය කලා ඉතිහාසය ගවේෂණය කිරීමේ දී පොතපත අවැසි වුවත් නූතන විකල්පීය ප්‍රවණතාවන් පිළිබඳ කිසිඳු ශාස්ත්‍රීය ලේඛණයක් මේ වන විට ලියා නැති බැවින් ද ඒ ප්‍රවණතාවන් පිළිබඳ අධ්‍යයනයක අවශ්‍යතාව බොහෝ කලක සිට දැනුණු බැවින් ද මේ අධ්‍යයනය මට ආස්වාදය ගෙන දෙන්නක් විය. එ බැවින් මාගේ පර්යේෂණ නිබන්ධයේ අරමුණ වූයේ එකී ප්‍රවණතාවන් නූතන වේදිකාවේ අර්බුදයන් ජයගනිමින් ලාංකේය නාට්‍ය කලාව කෙතරම් දුරට ජන ගත  කළේ ද යන්න සොයා බැලීම යි.

නමුත් අධ්‍යයනයේ දී මට වැඩිපුර භාවිත කිරීමට සිදු වූයේ අන්තර්ජාල මූලාශ්‍ර යි. ඒ මඟින් දක්නට ලැබුණු ප්‍රවණතා ඔස්සේ ලාංකේය වේදිකාව පෝෂණය වී ඇති අයුරු ද තව දුරටත් ඒවා වර්ධනය කළ හැකි අයුරු ද ඒවා ලාංකේය වේදිකාවට ගැලපෙන පරිද්දෙන් වෙනස් කළ යුතු වී නම්  ඒ කෙසේ ? ද යන වගත් මම අධ්‍යයනය කළෙමි. ඊට මම බොහෝ දුරට විදේශිය නව රඟහලවල් පිළිබඳ ව නිර්මාණය වූ වාර්තා චිත්‍රපට පිටිවහල් විය.

ලංකාවේ මෑත කාලීන ප්‍රවණතා ලෙස මෙම පර්යේෂණයේ දී හඳුනාගත් පූල් තියේටර් , බ්ලැක් බොක්ස් තියේටර්, ජනකරළිය ජංගම රඟහල පිළිබඳ ලියැවුණු එකඳු ග්‍රන්ථයක් හෝ අන්තර්ජාල මූලාශ්‍රයක් නොමැති වුවත් වේදිකානාට්‍ය ක්ෂේත්‍රයේ රංගන ශිල්පියෙකු වසයෙන් සිටීම ද වසර ගණනාවක සිට ජන කරළිය මඟ සම්බන්ධ ව කටයුතු කිරීමට අවස්ථාව ලැබීම ද සියලු නාට්‍ය උළෙල නැරඹීම ද මේ ප්‍රවණතා පිළිබඳ උනන්දුවෙන් අධ්‍යයනය කිරීම ද මට දීර්ඝ කාලීන ක්ෂේත්‍රීය නිරීක්ෂණයක් ම විය. එ බැවින් පර්යේෂණයේ දී මතු වූ ගැටළු තවත් රසවත් සෙවීමකටත් ගවේෂණයකටත් හේතු වූවා මිස ඒවා කිසි විටෙක ගැටළු වසයෙන් ඉතිරි නො වීය. යම් හෝ අපහසුතාවකට මා පත් වූයේ නම් ඒ රඟහල පිළිබඳ ඉංග්‍රීසි නො වන වාර්තා චිත්‍රපටයන්හි භාෂාව තේරුම් ගැනීමට නොහැකි වීම ය.

## පටුන


| | |
|---|---|
| **පළමු වන පරිච්ඡේදය** | **පිටුව** |
| සිංහල නාටකයේ සංක්ෂිප්ත ඉතිහාසය | 1 - 15 |
| **දෙ වන පරිච්ඡේදය** | |
| ලාංකේය විකල්ප නාට්‍ය කලාව | 17- 24 |
| 2:1 පන්තිකාමර නාට්‍ය | 17 |
| 2:2 පාසල් නාට්‍ය | 18 |
| 2:3 පාස්කු නාට්‍ය | 18 |
| 2:4 වෙසක් නාට්‍ය | 19 |
| 2:5 රූකඩ නාට්‍ය | 19 |
| 2:6 පසුබිම් දෙබස් කථන මුද්‍රා නාට්‍ය (ජහුටා) | 21 |
| 2:7 වීදි නාට්‍ය | 21 |
| 2:8 කෙටි නාට්‍ය | 22 |
| 2:9 බ්ලැක් බොක්ස් නාට්‍ය | 23 |
| 2:10 ජන කරළිය නාට්‍ය | 24 |
| **තෙ වන පරිච්ඡේදය** | |
| නූතන ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවේ අර්බුදය | 25 - 36 |
| **සිව් වන පරිච්ඡේදය** | |
| නූතන ලාංකේය නාට්‍ය කලාවේ විකල්පීය ප්‍රවනතා | 37 - 65 |
| 4.1 පූල් තියේටර් | 37 |
| 4.2. බ්ලැක් බොක්ස් රඟහල සම්ප්‍රදාය | 37 |
| 4:3 ජන කරළිය | 45 |
| 4:3:1 ඇවිදින රඟහලක් | 45 |

4:3:2 ජන කරළිය 45

4:3:3 ජන කරළිය ජංගම රඟහල සංකල්පය 46

4:3:4 ජන කරළිය ජංගම රඟහල (මව් රඟහල) 49

4:3:5 ජන කරළිය කුඩා ජංගම රඟහල 51

4:3:6 ජන කරළිය ක්‍රියාන්විතය. 52

4:3:6:1 ජන කරළිය නාට්‍ය කණ්ඩායම 52

4:3:6:2 පරාක්‍රම නිරිඇල්ල බහුවාර්ගික භාවිතය 53

4:3:6:3 ජන කරළිය ගමින් ගමට 56

4:3:7 ජන කරළිය නූතන නාට්‍ය කලාවට විකල්පයකි. 60

4:3:8 ජන කරළිය නාට්‍ය නිර්මාණ 62

4:3:8:1 සිංහල භාෂා නිර්මාණ 62

4:3:8:2දමිළ භාෂා නාට්‍ය නිර්මාණ 63

4:3:9 ජන කරළිය ඉදිරි අරමුණු 63 - 64

**සමාලෝචනය** 66 - 69

**ආශ්‍රිත ග්‍රන්ථ** 70 - 74

# ස්තුතිය

- පර්යේෂණ නිබන්ධ මාතෘකාව අනුමත කර දුන් හිටපු අධ්‍යයනාංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒන්ජල් කොටවල ගෙදර මහත්මියට

- මාගේ නිබන්ධ උපදේශකවරයා ලෙස කටයුතු කරමින් මඟ පෙන් වූ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී.ඩී සුගතපාල මහත්මාට

- මා නාට්‍ය පෙර පුහුණුවක හෝ වෙනත් කටයුත්තක යෙදී සිටි සෑම අවස්ථාවක ම අතපසු වූ දේශන සටහන්,නිබන්ධන සොයාවිත් හෝ ලබා දෙමින් අධ්‍යයන කටයුතු අතපසු වීමට නොදී නිබඳ ව සොයා බැලූ තිළිණි නිසංසලා සහෘදියට

- සිය වටිනා කාලය කැප කරමින්  තොරතුරු හා දැනුම ලබා  දුන් රාජිත දිසානායක, එම්. සෆීර්, පරාක්‍රම නිරිඇල්ල නාට්‍ය වේදීන්ට

- මාගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් නිබඳව අනුග්‍රහය දැක් වූ රාණි පුංචී, රූපසිංහ මාමා ඇතුළු පවුලේ ඥාතීන් සැමට

- සැම විටම දිරියට  උන් සහ විවධ අයුරින් සහය වූ රසාංජලීට

- අන්තර්ජාල ලිපි කිහිපයක් සොයා දුන් ධම්මික හේවගේ සහෘදයාට

- හැම විටම හරියට යමක් කරන්න කියා දුන් මහාචාර්ය ජයන්ත අමරසිංහ ඇදුරු තුමාට

- ශ්‍රී ලංකා නාට්‍ය අණුමණ්ඩලයේ මහානාම මහත්මියට

- නිබන්ධනය මුද්‍රණයට මුදල් ලබා දුන් මල්ලීට

# පිදුම

අප වෙනුවෙන් මහපොළොවට ගත දිය කරන තාත්තාට

මා එන තුරු මඟ බලන අම්මාට

මා ගැන බලාපොරොත්තු පොදි බඳින අයියාට

සහෝදර වෘත පුරන මල්ලීට

පාසලේ දී මා ගැන පුරසාරම් දොඩන නංගීට

සෙනෙහසිනි